# වේවැල් වියන්නිය

ඒ දඩයම් වාරය ආරම්භ වීම නිමිත්තෙන් බෝර්තා හාමු මහත්තයාගේ නිවසේ පැවැති රාත්‍රි භෝජන සංග්‍රහයේ අවසාන අවස්ථාවයි. දඩයක්කාරයන් හය දෙනෙක්, තරුණ ස්ත්‍රීන් අට දෙනෙක් සහ ප්‍රාදේශීය වෛද්‍යවරයා මලින්, පලතුරෙන් පිරුණු, අලෝක කරන ලද විශාල මේසය වටා අසුන්ගෙන සිටියහ.

මෙම පිරිස අතර ආලය සම්බන්ධයෙන් කතාබහක් පටන්ගත්තේය. ඒ හරහා මහා සාකච්ඡාව, එනම් කිසිදාක අවසානයක් නො දකින මහා සාකච්ඡාව ආරම්භ විය. එම විවාදයේ තේමාව වූයේ එක්වරක් හෝ කීපවරක් සැබෑලෙස ම ආලය කළ හැකිදැයි යන්න විය. තම මුළු ජීවිත කාලයටම තථ්‍ය වූ එක් ආදරයක් පමණක් හදුනාගත් මිනිසුන් ගැන උදාහරණ ගෙනහැර පාන ලද්දේය. අධික තර සංවේදීතාවයකින් යුක්තව අනවසරයෙන් ප්‍රේම කළ පුද්ගලයන් ගැන ද විවිධ කතා ඉදිරිපත් විය.

පිරිමි පක්ෂයේ මතය වූයේ ආදරය අසනීපයක් මෙන් එක් පුද්ගලයකු හට කීපවරක් වැළඳිය හැකි බවය. එමෙන් ම එසේ උපදින ආලය බාධාවක් පැනනැගි කල්හි ඔහුගේ මරණයට පවා එය හේතුකාරක වන බව ද එහිදී සඳහන් විය. පිරිමින්ගේ මෙම දෘෂ්ටිය අභියෝගයට ලක්කළ නොහැකි වුව ද නිරීක්ෂණයට වඩා කාව්‍යමය හැඟීම් කෙරෙහි වඩා බර වූ කාන්තා පක්ෂයේ අදහස වූයේ ආලය, සැබෑ ආලය, උත්කෘෂ්ඨ වූ ආලය කෙනෙකු තුළ ජනිත විය හැක්කේ මුළු ජීවිත කාලයට ම එක් වරක් පමණක් බවත්, එවැන්නක් විදුලි කෙටීමක් හා උපමා කළහැකි බවත්, එවන් ආදරය විසින් ස්පර්ශිත වූ හදවතක් එම ආලයෙන් ම ශූන්‍ය වී විනාශ වී, ගිනිගැනී වෙනත් කුමන හෝ ප්‍රබල හැඟීමකට සිහිනයෙන් හෝ ඒ තුළ ඉපදීමට ඉඩ නොදී පවත්නා බවය. හාමු මහත්තයා බොහෝ වාරගණනක් ආදරය කර තිබෙන බැවින් මෙම විශ්වාසයට එරෙහිව දැඩිව පහර දුන්නේය.

මා කියන්නේ මුළු හදින් ම, සම්පූර්ණ ශක්තියෙන් යුක්තව වාර කීපයක් ආලය කරන්ඩ පුළුවන් කියලයි. ඔහේල මට කියන්නෙ දෙවැනි ප්‍රේමයක් ගැන හිතන්ඩ බැරිව දිවි තොරකර ගත්තු මිනිසුන් සිටිය කියලනෙ. මා කියන්නේ ඔවුන් එම මෝඩකම කරගන්නේ නැතුව හිටිය නම් ඒ වේදනාවෙන් සුවපත් වෙන්ඩ තිබුණ කියලයි. ඊට පස්සෙ ඒ අය තම ස්වාභාවික මරණය එනකම් ම ආයෙ ආලය කරන්ඩ ඉඩ තිබුණා. බේබද්දො වාගෙ ප්‍රේමවන්තයො ඉන්නව බීමට ඇබ්බැහි වෙච්ච මිනිහා බොනව. ආලය කළ තැනැත්තා ආලය කරනව. මේක මනසේ පහළවෙන හැඟීමක් "

මහළුව විශ්‍රාම ගොස් පැරිසියේ සිට ගමට පැමිණ සිටින වෛද්‍යවරයා මෙම සාකච්ඡා වටයේ විනිශ්චයකරුවා ලෙස යෝජනා කරනු ලැබීය. මෙම සාකච්ඡාවට දායක වී තම මතය ප්‍රකාශ කරන ලෙස සියල්ලෝ ම ඔහුගෙන් ඉල්ලා සිටියහ.

සැබැවින්ම වෛද්‍යවරයාට ඒ පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීමට තරම් දෙයක් නොවීය. හාමු මහත්තයා කී පරිදි ආදරය නමැති මෙම සංකල්පය හිතේ ඇතිවන හැඟීමක් පිළිබඳ ප්‍රශ්නයක් පමණි.

"මා දැනගෙන හිටිය අවුරුදු පණස් පහක් තිස්සේ එක ම එක දවසකටවත් වෙනස් නොවී තිබුණු ඒ වාගෙ ම මරණයෙන් අවසන් වූ ප්‍රේමයක්. "

එවිට හාමිනේ අත්පොලසන් දුන්නාය.

"ඒක කොච්චර ලස්සන දෙයක් ද. එහෙම ආදරයක් ලැබෙන එක කොච්චර සුන්දර හීනයක් ද. මෙම මහා ගැඹුරු. විනිවිද යන ආදරයෙන් වෙලිල. ඉන් මුසපත් වෙලා අවුරුදු පණස් පහක් ජීවත්වෙන්ඩ ලැබීම කොච්චර නම් වාසනාවක් ද. එම ආදරවන්තයො දෙන්නගෙ ජීවිතය නම් සැබෑ ආශිර්වාදාත්මක එකක් වෙන්ඩ ඇති.

ආ....." වෛද්‍යවරයාගේ මුවට මඳ සිනාවක් නැගුණි.

"ඇත්තටම හාමිනේ මේක වරදවා වටහා ගන්ඩ එපා. එම ආදරය ලැබුණෙ පිරිමියෙකුට. මෙතන ඉන්න ඔබ සියළු දෙනා ම ඔහු හොඳින් අඳුනනවා. ඒ මේ ගමේ ඖෂධ වෙළෙන්දා. ෂුකේ මහත්තෙය. ආදරය කළ තැනැත්තිත් ඔබ සියළු දෙනාම දන්න කෙනෙක්. හැම අවුරුද්දෙ ම වලව්වට ආපු පුටු වියන ගැහැණිය. මා ඒ කතාව මුල ඉඳල කියන්නම්." ස්ත්‍රී පක්ෂයේ උනන්දුව හින වී ගියේය. තම මුහුණු පුළුටු කර ගත් ඔව්හු " මේ මොන මළ ඉලව්වක්දැ"යි කීහ. ඔවුන් එසේ කීයේ වැදගත් උසස් මිනිසුන් කෙරෙහි පමණක් මෙම ආදරය පිහිටන බවක් සිතන්නාක් මෙනි. එය ඒ අයටම පමණක් උරුම වූ දෙයක් බව සිතින්නාක් මෙනි.

වෛද්‍යවරයා තම කථාව පටන්ගත්තේය.

"මාස තුනකට ඉස්සෙල්ලා මේ ගැහැණිය මාව තමන්ගේ මරණ මඤ්චකය වෙත කැඳෙව්වා. ඊට කලින්දා ඈ ඔබ සියළු දෙනාම දැක තිබෙන අශ්වයා බැඳි කරත්තයෙන් ඇවිල්ල හිටියා. එම කරත්තයම තමා ඇගේ වාසස්ථානය වුණෙත්. ඈ ඇවිල්ල හිටියෙ තමන්ගේ ආරක්ෂකයො වාගේම යහළුවන්ද වශයෙන් හිටිය ලොකු බල්ලො දෙන්නක් එක්කයි."

"ඒ වෙනකොට පියතුමාත් එතැනට ගිහිල්ල හිටිය. ඈ ඇගේ අන්තිම කැමැති පත්තරය අපට පවරල එම අන්තිම කැමැත්තේ අරුත අප ඉදිරියේ හෙළිකලා. ඇගේ මුළු ජිවිත කාලයම ඈ අප ඉදිරියේ දිගෑරියා. එවැනි අසාමාන්‍ය ඒ වාගේ ම හෘදයාංගම වූ කතාවක් මා කිසිදාක අසා නැත ."

"ඇගේ පියාත් මවත් දෙදෙනා ම වේවැල් විවීම ජිවිකාවෘත්තිය කරගෙන ජිවත් වූ අය. ඈට මහ පොළව මත තැනූ නිවසක් කවම දාකවත් තිබිල නෑ. අපිරිසිදු ඒවාගෙම අප්‍රසන්න වැරහැලි ඇඳගත් ඈ ළදරු කාලයේ පටන් ම දෙමාපියන් යන යන තැන ඇවිද්ද එකමයි කළේ. ගමකට ඇතුළුවෙන දොරකඩදී ඔවුන්ගේ වාහනය නතර කරල ඒක අදින සතා තණකොළ කන්ඩ මුදාහරිනව. ඊට පස්සෙ බල්ලා තම අත්දෙක මතින් හොම්බ තියාගෙන නිදාගන්නව. ඇගේ අම්මත් තාත්තත් පාර දෙපැත්තෙ තියෙන එල්ම් ගස් හෙවනට වෙලා මුළු ගමේම තියෙන පරණ පුටු වියන්ඩ පටන්ගන්නව. කුඩා දැරිය තණබිස්ස මත්තෙ දුව පැන ඇවිදිමින් කාලය ගෙවා දානව. මෙම ජංගම නිවස තුළ කිසි තකාබහක් සතුටු සාමීචියක් සිදුනොවූ තරම්ය. ගමේ ගෙවල් පසුකරයද්දී හඬනගා කිවයුතු වූ පුටු වියනවෝ ! වේවැල් ! වේවැල් !! වැනි අත්‍යවශ්‍ය වචන කීපය හැරුණු විට වෙනත් වචනයක් භාවිතා නොවීය. දෙමාපියෝ මුණට මුණ ලා හෝ පැත්තකට හැරී වේවැල් විවීම කළහ. දැරිය ඕනෑවට වඩා දුර ගියහොත් එහෙමත් නැත්නම් ගමේ ගැටව් එක්ක ගණුදෙනුවකට ගියොත් කෝපයෙන් පිපිරෙන පියා ඈ ආපසු කැඳවන්නේ බැණ වැදීමෙනි."

"කාලකණ්ණි එකියෙ මෙහෙ එනවද නැද්ද?"

ඇගේ කණවැකුණු මුදු ආදර වදන් ඒවා පමණක් ම විය. බහතෝරන වියට පත්වෙච්ච ගමන්ම වියන ලද පුටුවල මිළ එකතු කරන්නට ඈ යවනු ලැබුවා. ඒ මගින් ඈට ගමේ තැනින් තැන කොළු ගැටව් කීපදෙනෙකු හඳුනා ගන්නට ඉඩ ලැබුණා. එහෙම වෙලාවට ඒ දරුවන්ගෙ දෙමාපියෝ



**ප්‍රංශ කෙටිකතා රචක ගී ද මෝපසාං ගේ කතාවක් වන මෙය මණ්ඩාවල පඤ්ඤාවංස හිමියන් විසින් සිංහලට පරිවර්තනය කර පළකර තිබෙන වටුකුරුළු කතා කෘතියෙන් උපුටා ගන්නා ලදි.**

කුරිරු ලෙස තම දරුවන් කැඳවන්න මෙහෙම කියමින්: 'උඹ මෙහෙ එනවද නැද්ද? ආතපාත නැති කාලකණ්ණි පාදඩයෙක් එක්ක උඹට තියෙන කතා මොනවද ?'

බොහොම අවස්ථාවල ගමේ කොළු කුරුට්ටෝ ඈට ගල් බොරළු වලින් දමල ගැහැව්වා. සමහර ගෑණු ඈට වැඩිපුර කාසි කීපයක් දෙන අවස්ථා ද තිබුණා. ඈ එහෙම ලැබෙන කාසි පරිස්සම් කරල තියාගත්තා.

එක දවසක්, එතකොට ඇගේ වයස අවුරුදු එකොළහක් පමණ ඇති. මෙම ගම් ප්‍රදේශය පහුකරගෙන යද්දී කුඩා ෂුකේ ඈට මුණගැහුණා. ඔහු හිටියේ අඬ අඬා. ඒ යාළුවෙක් තමන්ගෙ කාසි දෙක උදුරගෙන තිබුණ හින්දයි.

තම දුප්පත් වැරහැළි ඇඳුම ඇඳගෙන සිටිය ඈ හිතාගෙන හිටියේ මෙම පහළ මැද පංතියේ දරුවා නිතර ම සතුටින් ඒ වාගේ ම කෙළිදෙලෙන් ඉන්නව කියලයි. මෙම දරුවාගේ කඳුළු දුටු ඈ මහත් සේ වික්ෂිප්ත වුණා. ඒ හැඟිමෙන් ම ඈ ඔහු වෙතට ළංවුණා. ඔහුගේ දුකට හේතුව දැනගත් ඈ තම මුළු සේසත ම එනම් කාසි හතම ඔහු අතට දුන්නා. ඔහු එක අතකින් කඳුළු පිස දමමින් කාසි ටික අතට ගත්තා. එම මෙහොතේ ප්‍රීතියෙන් ඉපිල ගිය ඈ තුළ මේ කොළු පැංචා ඉඹගන්ඩ ආශාවක් ඇතිවුණා. ඒ සමගම ඊට ධෛර්යයක් ද ඈ තුළ උපන්නා. ඔහු තමන්ගෙ අතේ තියන කාසි ගැන කල්පනා කරමින් සිටි බැවින් ඈට හිතේ හැටියට ඔහුගෙ මුණ සිපගන්ඩ පුළුවන් වුණා. තල්ලුකිරීමක් හෝ පහරදීමක් නොකෙරුණු බැවින් ඈට නැවත නැවත ඔහුව සිපගන්නට අවස්ථාව ලැබුණා. තම දෑතින් ම ඔහු අල්ලාගත් ඈ මුළු හදින් ම ඔහුව සිපගත්තා. ඊට පස්සෙ දුවගෙන ම ආපසු ආවා. මෙම අසරණ චිත්තයා තුළ ඇත්තටම සිදුවුණේ මොකක් ද? තමා ගම්නියම්ගම් පුරා ඇවිදිමින් හරිහම්බ කරගත්තු මුළු සේසත ම මෙම කොළුපැටියට පරිත්‍යාග කළ නිසා ඈ මොහුට බැඳුනා ද එහෙම නැත්නම් තම කුළුඳුල් චුම්බනය ඒ දරුවට පුදකළ නිසා ඔහු කෙරෙහි බැඳුනා ද?

දරුවන්ටත් වැඩිහිටියන්ටත් එය එක ලෙස ම අබිරහසක් !

ඈ කනත්ත පිටිපස්සේ පිහිටි එම ස්ථානය ගැනත් එම දරුවා ගැනත් මාස ගණනාවක් තිස්සේ මෙනෙහි කරමින් කාලෙ ගතකලා. ඈ ඔහු නැවත දකින බලාපොරොත්තුව හිතේ තියගෙන වේවැල් විවීමකට ලැබෙන මුදලකින් කීයක් හරි එහෙමත් නැත්නම් කඩෙන් බඩුවක් ගේන්ඩ දෙන මුදලකින් කීයක් හරි මිටමොලවා ගනිමින් සුළු මුදලක් ඉතිරිකර ගත්තා.

ඈ දෙවැනි වර මෙම ගමට ආ දවසෙ ඇගේ පසුම්බියේ ප්‍රැංකු දෙකක මුදලක් එකතු වී තිබුණා. ඒත් ඇගේ අවාසනාව ඈට ඖෂධ වෙළෙන්දගෙ දරුව යන්තම් දැකගන්ඩ ඉඩ ලැබුණෙ ඒ දරුවගෙ පියාගෙ වෙළඳ ශාලාවෙ රතුපාට බේත් වතුර පිරිච්ච විශාල බෝතලා අතරින් පමණයි.

ඔහු ඉතා පිරිසිදුවට ඇඳගෙන ඉන්න ආකාරය ඒ වර්ණවත් ජලය පිරිච්ච බෝතල් අතරින් ඈට දැකගන්ඩ හැකිවුණා. ඈ හැඟීම් බරව, කුල්මත්ව, උත්සුව තම ආලය තව තවත් වඩා වර්ධනය කරගත්ත. කිසියම් ම ආකාරයකින් මකා දැමිය නොහැකි සිහිවටනයක් ඈ ඇගේ සිත තුළ සඟවා ගත්තා.

ඊළඟ පාසැල් නිවාඩුවේ දී තම යහළු කොළු පැටවුන් සමග

> ***ආරම්භයේදී මා ඔබට කි පරිදි පසුගිය වසන්තයේ දී ඈ මියගියා. මෙම ඛේදජනක කතාන්තරය කියා අවසන් කළ ඈ නිසි ආහාරයක් හෝ නො ගෙන කුසගින්නේ පවා ඉඳිමින් ඉතිරි කරමින්, ඈ මියගිය පසු ඔහුට ඈ ගැන අඩුතරමින් එක්වරක් වත් කල්පනා වේවායි පතාගෙන වැඩ කරමින් එසේ ඇගේ මුළු ජිවිත කාලය තුළ ම ඉතිරි කළ ධනය ඈ මුළු හදින් ම ඉවසීමෙන් යුතුව ආදරය කළ ඒ පුද්ගලයාට බාරදෙන්නැයි කියා මගෙන් ඉල්ලා සිටියා. ඈ එලෙසින් මා වෙත පැවරූ මුළු මුදල***

ඇටබෝල සෙල්ලම් කරමින් සිටිනු දුටු ඈ ඔහු වෙතට පැන තම දෑතින් ම බදාගෙන සිපගත්තා. ඇගේ සිපගැනීම කොතරම් දැඩිවුවා ද කිවහොත් ඔහු බියටපත් ව කෑගසන්ඩ වුණා. එවිට ඔහුව සංහිඳවන්නට තමා අත තිබුණු මුළු මුදල එනම් ප්‍රැංක තුනක් සැබෑම ධනයක් ඔහු අතට දුන්න. එම කාසි දුටු සැණින් ම ඔහු තම දෑස් ලොකු කරගෙන ඒ කාසි දිහෑ බලාගෙන ඉන්ඩ වුණා. ඔහු ඈට ඇති තරම් තමාව සිපගන්නට ඉඩදීගෙන එහෙම ම හිටියා.

තවත් අවුරුදු හතරක් තිස්සේ ඈ තමා හිතාමතා ම රැස්කර ගත් ධනය තම සිපගැනීම් වලට හිලව්වනු පිණිස පරිත්‍යාග කළා. එක් වරක කාසි තිහකි. තවත් අවස්ථාවක ප්‍රැංක දෙකකි. වෙනත් අවස්ථාවක කාසි දොළහකි. එවර ඈ ලැජ්ජාවට පත්ව අඬා වැටුණා. (ඒ වසර ඉතා නරක කාලයක්) අවසන් අවස්ථාවේ ප්‍රැංක පහක ලොකු රවුම් කාසියක්. ඒ කාසිය නෙත ගැටුණ ගමන් ම ඔහුගෙ මුණෙ ලොකු හිනාවක් පැතිරුණා. ඈ කල්පනා කළේ ඔහු ගැන ම පමණයි. වෙන කා ගැනවත් කල්පනා කළේ නෑ. ඔහුත් ඈ ආපසු එනතුරු එක්තරා නොඉවසිල්ලකින් බලාගෙන හිටියා. ඈ ඉදිරියෙන් ඈ දෙස බලාගෙන එහෙ මෙහෙ දිව්වා. මෙය දකින ඈගේ හදවත කුල්මත් වෙලා ගියා.

අනතුරුව ඈ ගමට එද්දි ඔහු අතුරුදහන් වෙලා. ළමයා මහා විද්‍යාලෙකට ඇතුල් කරල. ඈ උපක්‍රමශීලි ලෙස අනුන්ගෙන් ප්‍රශ්න නගමින් මේ බව දැනගත්ත. ඊට පස්සෙ ඈ පාසැල් නිවාඩු කාලය එද්දි මෙම ගම්මානය හරහා යන්ඩ නොයෙක් ආකාරයේ උපාය උපයෝගී කරගෙන තම දෙමාපියන්ගෙ සාමාන්‍ය ගමන් මග වෙනස් කරගන්ඩ උත්සාහ කළා. අන්තිමේ දි එම උපක්‍රමය සාර්ථක වුණා. ඒත් ඒ අවුරුද්දක් තිස්සේ කරන ලද කපටිකම් රාශියක ප්‍රතිඵල වශයෙනි. ඒ වන විට ඈ අවුරුදු දෙකක් තිස්සේ ම ඔහු දැක තිබුණේ නැත .

ඈට හඳුනාගන්නට බැරිතරම් ඔහු වෙනස් වෙලා. හුඟක් උසගොස් සිටියා. හුඟක් ලස්සන වෙලා. ඔහු රන්වන් පාට බොත්තම් ඇල්ලූ කබායක් ඇඳගෙනයි හිටියේ. ඔහු ඈ නො දුටු බවක් අඟවමින් ඔහු ඈ අසලින් ම මහා ආඩම්බර ලීලාවකින් ගමන් කළා. එම සිදුවීම හේතු කොට ගෙන මහත් කම්පාවට පත්වුණු ඈ දින දෙකක් තිස්සේ එක දිගටම ඇඬුවා. එතැන් පටන් ඇගේ හිත මහා ගින්දරකින් දැවෙන්ඩ පටන් ගත්තා. හැම අවුරුද්දක ම ඈ ඔහු දකින්ඩ ආවා. ඔහුට ආචාර කරන්ඩ එඩිතර නො වන ඈ ඔහු පහුකරගෙන ගියා. ඔහුට ඈ දෙස හොරැහින්

30 වන පිටුවට